# මිණිවන් පී. තිලකරත්නගේ තෘෂ්ණාභරණ

කුසුම් හේරත්

This paper intends to examine mainly the narrative structure, characterization and language, used in the Novel **Thushnabarana** by Miniwan P. Thilakarathne. The aspects like inspiration of classical literature on this fiction and its experimental qualities too will be taken into concession.

**තෘෂ්ණාභරණ** නවකතාව සඳහා පාදක වී ඇත්තේ **සද්ධර්මරත්නාවලියෙහි** ඇතුළත් සුබ සාමණේර වස්තුවයි. එම කතා පුවතෙහි අතීත කතාව හා වර්තමාන කතාව වශයෙන් දෙයාකාර වූ කතා දෙකකට ලැබුණ ද නවකතාකරුවා ඉන් භාවිතයට ගෙන ඇත්තේ අතීත කතාව පමණි. සද්ධර්මරත්නාවලියෙහි අන්තර්ගත කතාපුවත් මගින් පැරණි කතාකරුවා අපේක්ෂා කළේ බෞද්ධ පුරුෂාර්ථ මතුකොට හුදී ජන ප්‍රසාදය ඇති කිරීම මෙන් ම උපදේශයක් සැපයීමයි. වර්තමාන නවකතාකරුවාට එබඳු දර්ශනයක් මතු කිරීමට අවශ්‍ය නො වූණ බව ඔහුගේ ඇතැම් ප්‍රකාශ මගින් තහවුරු වෙයි.

සිංහල නවකතාවට ඓතිහාසික නවකතා කලාවක් උරුම වුව ද මෙම කෘතිය ඓතිහාසික නවකතාවක් වශයෙන් අපට විග්‍රහ කිරීමට නොහැකි වන තරමට කතුවරයා මෙම කෘතිය වර්තමාන සමාජය හා ගළපා ගනියි. එසේ වුව ද කතුවරයාට විෂය වන අත්දැකීම් පරාසය මෙන් ම ඔහු එයින් උකහා ගන්නා චරිතය හේතුවෙන් දත හෝ නොදත මෙම කෘතිය මගින් බෞද්ධ පුරුෂාර්ථ රැසක් ම අනාවරණය වන බව කිව යුතුය. පැරණි කතාකරුවාගේ පරමාර්ථයෙන් මදක් ඔබ්බට ගොස් සමාජ ශෝධනයක අවශ්‍යතාව හඳුනාගත් සැබෑ තරුණයකුගේ චරිතය කෘතියෙන් මතු වුව ද මූලික තේමාවෙන් ඉවත්වීමට කතුවරයාට නො හැකි වී ඇත.

පැරණි කතාවට පාදක වන කතාපුවත කෙටියෙන් විග්‍රහ කොට බැලීමෙන් මෙකරුණ වඩාත් තහවුරු වෙයි.

"පැරණි කාලයෙහි බරණැස් නුවර එක්තරා සිටුවරයෙක් දැහැමින් සෙමෙන් කටයුතු කර මරණයට පත්වෙයි. ඔහුගේ මරණයෙන් පසු ගන්ධක නම් වූ ඔහු පුත් සිටු තනතුරට පත්වෙයි. පිය සිටුතුමාගේ මරණයෙන් පසු අභිනව තනතුරට පත්වන